*සැ. යු.* — 2012.07.27 දින පළ වූ අංක 1,769 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,770 - 2012 අගෝස්තු මස 03 වැනි සිකුරාදා - 2012.08.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1300 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අගෝස්තු මස 24 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අගෝස්තු මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

## වයඹ පළාතේ පළාත් සභාව

**වයඹ පළාතේ පළාත් සභාවේ 2012 අංක ........................... දරන වයඹ ප්‍රජා මූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) විධිමත් කිරීමේ ප්‍රඥප්තිය**

මෙහි පහත පළකරන වයඹ පළාතේ පළාත් සභාවේ 2012 අංක ................................. දරන වයඹ ප්‍රජා මූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) විධිමත් කිරීමේ ප්‍රඥප්තිය අද දින සිට දින තිහක් ඉකුත් වීමෙන් පසුව වයඹ පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණු ඇතොත් ඒවා එදිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

නීතිඥ අතුල සරත් කුමාර විජේසිංහ,
ප්‍රධාන අමාත්‍ය, වයඹ පළාතේ මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන හා
පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු, ඉඩම්, ප්‍රවාහන, පරිසර,
සංචාරක, ආයෝජන, සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන
සහ ආහාර සැපයුම් හා බෙදාහැරීමේ අමාත්‍යාංශය.

**වයඹ පළාතේ පළාත් සභාවේ 2012 අංක....................දරන ප්‍රජා මූල සංවිධාන (ජලසම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) විධිමත් කිරීමේ ප්‍රඥප්තිය**

වයඹ පළාත තුළ තිරසාර ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘතීන් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම, පරිපාලනය කිරීම උදෙසා ප්‍රජා මූල සංවිධාන ස්ථාපිත කිරීම, මෙහෙයවීම හා විධිමත් කිරීම පිණිස පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය යටතේ ඒකකයක් ස්ථාපනය කිරීම සහ ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ප්‍රඥප්තියකි.

*පූර්විකාව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

වයඹ පළාත තුළ තිරසාර ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘතීන් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම, පරිපාලනය කිරීම, උදෙසා ප්‍රජා මූල සංවිධාන ස්ථාපිත කිරීම, මෙහෙයවීම හා විධිමත් කිරීම පිණිස පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය යටතේ ඒකකයක් ස්ථාපනය කිරීම සහ ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක දිනය

1. මෙම ප්‍රඥප්තිය 2011 අංක ........................ දරන "වයඹ පළාතේ ප්‍රජා මූල සංවිධාන ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලැබූ දින සිට බලාත්මක වන්නේය.

## I වැනි කොටස

**ප්‍රජා මූල සංවිධාන ස්ථාපිත කිරීම, මෙහෙයවීම හා විධිමත් කිරීම සඳහා පළාත් ඒකකය පිහිටුවීම හා එහි සංයුතිය හා පරිපාලනය**

පළාත් ඒකකය පිහිටුවීම

2. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සහ ඒ යටතේ පිහිටුවනු ලබන පළාත් කමිටුවේ පරමාර්ථ හා කර්තව්‍යයන් ඉටුකරලීම උදෙසා අවශ්‍ය වන පළාත් පානීය ජල හා පාරිසරික සනීපාරක්ෂක ඒකකයක් මෙහි මින් මතු "පළාත් ඒකකය" ලෙස හැඳින්වෙන පළාතේ පළාත් පාලන විෂයභාර ලේකම්වරයාගේ කාර්යාලයෙහි ස්ථාපනය කළ හැක්කේ ය.

පළාත් ඒකකයේ සංයුතිය

3. (i) පළාත් ඒකකයේ අධ්‍යක්ෂවරයා වශයෙන් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත්කළ යුත්තේ ය.

(ii) පළාත් ඒකකයෙහි රාජකාරි ඉටුකිරීමට අවශ්‍ය වන්නා වූ කාර්යය මණ්ඩල සහාය, වයඹ පළාත් රාජ්‍ය සේවයේ නියුතු යම් නිලයක් දරන්නකුට රාජකාරි පැවරීම මගින් ලබා ගැනීමට පළාතේ ප්‍රධාන ලේකම්වරයාට නියමයක් මගින් විධිවිධාන සැලැස්විය හැක්කේ ය.

*පළාත් ඒකකයෙහි පරිපාලනය*

4. පළාත් ඒකකයෙහි කෙරෙන්නාවූ සියලුම කාර්යන් හා කර්තව්‍යයන් පිළිබඳ පරිපාලනය පළාතේ ප්‍රධාන ලේකම්වරයාගේ නියෝගවලට යටත් ව පළාත් පාලන විෂය භාර ලේකම්වරයා වෙත පැවරෙන්නේ ය.

*පළාත් ඒකකයේ වැටුප් හා දීමනා*

5. ඉහත 03 වන වගන්තිය යටතේ තම නිත්‍ය තනතුරට අතිරේකව පළාත් ඒකකයෙහි රාජකාරි පැවරෙන නිලධාරියෙකුට එසේ රාජකාරි පැවරීම මත සිය නිත්‍ය තනතුරට හිමි වැටුප් හා දීමනා වලට අතිරේකව පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් ගෙවිය හැක්කේ ය.

## II වැනි කොටස

### ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචිය හා අධීක්ෂණය

*ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචිය*

6. (1) මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දින වන විට පළාතතුල ජල සම්පාදන හෝ පාරිසරික සනීපාරක්ෂාවට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන පරිපාලනය කරන හෝ එකී ව්‍යාපෘති වැඩ වලට ආදල වූ කිසියම් කාර්යක නියැලී සිටින සෑම ප්‍රජා මූල සංවිධානයක්ම ප්‍රඥප්තිය බලාත්මක වී මාස 3ක් ඉක්මයාමට ප්‍රථම පළාත් ඒකකයේ ප්‍රධානියා වෙත විධිමත් අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ලියාපදිංචි විය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දිනයෙන් පසුව සැලසුම් කොට ආරම්භ කරන්නාවූ ජල සම්පාදන හෝ පාරිසරික සනීපාරක්ෂාවට අදාල යම් ව්‍යාපෘතියක් පිළිබඳව ඕනෑම කාර්යකට සම්බන්ධ වන්නාවූ සෑම ප්‍රජා මූල සංවිධානයක්ම එසේ සම්බන්ධ වීමට දින 14කට පෙර පළාත් ඒකකයේ ප්‍රධානියා වෙත ලියාපදිංචිය සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

(3) ඉහත (1) හා (2) උප වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අනුව මාස 3ක් ඇතුළත ප්‍රජාමූල සංවිධාන ලියාපදිංචි කිරීමට හෝ හේතු දක්වා ප්‍රතික්ෂේපකිරීමට පළාත් ඒකකයේ ප්‍රධානියා කටයුතු කළ යුතු ය.

*වාර්ෂික බලපත්‍ර*

7. (1) එසේ ලියාපදිංචි වීමෙන් පසු ඒ සෑම ප්‍රජා මූල සංවිධානයක් ම ජල සම්පාදන කටයුතු කර ගෙන යාම සඳහා පළාත් ඒකකය වෙතින් වාර්ෂික බලපත්‍රයක් ලබා ගත යුතු ය.

(2) ඒ සඳහා විධිමත් අයදුම්පතක් පළාත් ඒකකයේ ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ දී හෝ පසුව හෝ ඒකකයේ ප්‍රධානියාට අවශ්‍ය වන්නේ නම්, අදාල ජල මූලාශ්‍රයේ බැක්ටීරියා සහ රසායනික තත්ව පරීක්ෂණ වාර්තාවක්, ප්‍රජා මූල සංවිධානයේ වාර්ෂික විගණන වාර්තාවක් අදාල වන්නාවූ වෙනත් යම් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නියම කළ හැකිය.

(3) මෙම වාර්තා සහ අනුෂංගික වෙනත් කරුණු සැලකිල්ලට ගෙන පළාත් ඒකකයේ ප්‍රධානියා විසින් වාර්ෂික බලපත්‍රයක් නිකුත් කිරීම හෝ නොකිරීම කළ යුතු ය.

(4) වාර්ෂික බලපත්‍රය නිකුත් නොකරන්නේ නම් අදාල වාර්තාව ද සමග නිවැරදි ලෙස අයදුම්පත ඉදිරිපත් කළ දින සිට මසක් ඇතුළත හේතු සහිතව ඒ බව ඒකකයේ ප්‍රධානියා විසින් අදාල ප්‍රජා මූල සංවිධානයට ලිඛිතව දැක්විය යුතු ය.

(5) එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පතක් පිළිබඳ ප්‍රතික්ෂේප කළ දින සිට සති දෙකක් ඇතුළත ලේකම්වරයාට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එබඳු අභියාචනා පිළිබඳව ලේකම්වරයාට සුදුසු තීරණයක් ගත හැකිය.

(6) වාර්ෂික බලපත්‍රයක් රහිතව යම් ප්‍රජා මූල සංවිධානයක් පානීය ජල සම්පාදන කාර්යයෙහි නියැලෙන්නේ නම් එම ප්‍රජා මූල සංවිධාන සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ 5 වැනි වගන්තිය ප්‍රකාර කටයුතු කළ යුතු වන්නේ ය.

*ප්‍රජා මූල සංවිධාන අධීක්ෂණය*

8. ඉහත 6 වගන්තිය යටතේ ලියාපදිංචි වන්නා වූ ප්‍රජා මූල සංවිධානවල කාර්යයන් වත්කම් හා වගකීම් අධීක්ෂණය, විමර්ශනය හා උපදෙස් දීම පිළිබඳ බලය ඒකකයට හෝ ඒකකයේ මගපෙන්වීම හා උපදෙස්වලට අනුකූලව එකී ප්‍රජා මූල සංවිධානය පිහිටි බල ප්‍රදේශයට අයත් පළාත් පාලන ආයතනයට ඇත්තේය.

*අමාත්‍යවරයා සතු බල තල*

9. (1) ඉහත 6 වගන්තිය යටතේ ලියාපදිංචි වන්නාවූ ප්‍රජා මූල සංවිධාන වල කාර්යයන් හා කර්තව්‍යයන් පිළිබඳව මගපෙන්වීම හා උපදෙස් දීම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාට කළ හැක්කේ ය.

(2) අමාත්‍යවරයා විසින් කරනු ලබන එබඳු මගපෙන්වීම් හා උපදෙස් ඒකකයේ ප්‍රධානියා විසින් ප්‍රජා මූල සංවිධාන වෙත දැන්විය යුත්තේ ය.

(3) එසේ දෙනු ලබන මගපෙන්වීම හා උපදෙස් අදාල ප්‍රජා මූල සංවිධානය විසින් ක්‍රියාත්මක නොකරන්නේ නම් හෝ පැහැර හරින්නේ නම් විෂය භාර අමාත්‍යවරයා විසින් පරීක්ෂණ නිලධාරියකු පත් කොට එම පරීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය මත ක්‍රියා කිරීම සඳහා විෂයය භාර ලේකම්වරයාට යොමු කළ හැක්කේ ය.

(4) මෙම ප්‍රඥප්තියේ සඳහන් කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අමාත්‍යවරයාට අවශ්‍ය අවස්ථාවලදී නියෝග පැනවිය හැක්කේ ය.

(5) පළාත් කමිටුවේ සහ ප්‍රාදේශීය කමිටුවල කාර්යයන් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන පැනවිය හැක්කේ ය.

(6) පළාත් කමිටුවට ස්වකීය බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යවරයාට කලින් කල මගපෙන්වීම් උපදෙස් හෝ නියෝග දිය හැකිය.

ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි නොවීම

10. (1) ඉහත 6 වගන්තියේ විධිවිධාන අනුව ලියාපදිංචිය නොවන හෝ 7 වගන්තිය අනුව වාර්ෂික බලපත්‍රය ලබා නොගත් ප්‍රජා මූල සංවිධාන මගින් මෙහෙයවනු ලබන හෝ පරිපාලනය කරනු ලබන පළාත තුළ පිහිටි ජල සම්පාදන හෝ පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳව ව්‍යාපෘති වල සියලු වත්කම් හා වගකීම් පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය මත ව්‍යාපෘතිය පිහිටි ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට පවරාගනු ලැබිය හැක්කේ ය.

(2) එසේ පවරා ගනු ලබන යම් ව්‍යාපෘතියක් පළාත් පාලන විෂයභාර ලේකම්වරයා නිශ්චය කරන පරිදි, පවරා ගනු ලැබූ පළාත් පාලන ආයතනය විසින් මෙහෙයවීම හා පරිපාලනය කිරීම හෝ ලේකම්වරයා විසින් පනවනු ලබන විධිවිධානයන්ට යටත් ව ප්‍රතිසංවිධානය කරන ලද ප්‍රජා මූල සංවිධානයකට පැවරීම කළ හැක්කේ ය.

## III වන කොටස

### ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳ පළාත් කමිටුව පිහිටුවීම, සංයුතිය හා කාර්යභාරය

පළාත් කමිටුව

11. විෂය භාර අමාත්‍යවරයා විසින් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳ මෙහි මින් මතු "පළාත් කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන පළාත්බද සම්බන්ධීකරණ කමිටුවක් පිහිටුවිය යුත්තේ ය.

පළාත් කමිටුවේ සංයුතිය

12. පළාත් කමිටුව පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා කමිටුවේ සභාපතිවරයා වේ.

(ආ) පළාත් ඒකකයේ ප්‍රධානියා කමිටුවේ ලේකම් ය.

(ඇ) පළාත් පාලන විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා,

(ඈ) පළාත් පාලන කොමසාරිස්වරයා,

(ඉ) දිස්ත්‍රික් ලේකම්ගේ නියෝජිතයෙක්,

(ඊ) අධ්‍යාපන විෂයභාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා,

(උ) ඉංජිනේරු සේවා විෂයභාර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයා,

(ඌ) ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයේ පළාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා,

(එ) පළාත් සභාවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා,

(ඒ) පළාත් පරිසර අධිකාරියේ අධ්‍යක්ෂවරයා,

(ඔ) පානීය හා සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති ක්‍රියාත්මක කරන පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්,

(ඕ) ප්‍රජාමූල සංවිධාන දිස්ත්‍රික් සංසදයේ සභාපති,

(ක) දැනට ක්‍රියාත්මක වන හෝ මින් මතු පළාත තුළ ආධාර යටතේ ක්‍රියාත්මක විය හැකි පානීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියක ප්‍රධානියා,

(ඛ) පළාත් මාර්ග දෙපාර්තමේන්තුවේ සහ මහා මාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන්.

පළාත් කමිටුවේ කාර්යභාරය

13. පළාත් කමිටුවේ කාර්යභාරය පහත පරිදි වේ :-

(අ) ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂාවට අදාල ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම,

(ආ) පළාත් තුළ ජල සම්පාදන හා පාරිසරික අවශ්‍යතා නිර්ණය කිරීම,

(ඇ) ඒකකය ඉදිරිපත් කරන සංවර්ධන සැලසුම් අනුමත කිරීම

(ඈ) පවත්නා ජල හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘති වල මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාවලීන් නිගමනය කිරීම,

(ඉ) ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති යෝජනා ක්‍රම හා වැඩ සටහන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීමේ නිර්දේශ විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම,

(ඊ) ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂාවට අදාළ ක්‍රියාකාරකම් හා සම්බන්ධිත රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික සහාය සේවා පද්ධතීන්ගෙන් සහාය ලබා ගැනීම හා සම්බන්ධීකරණය කිරීම.

14. (1) පළාත් කමිටුව යටත් පිරිසෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු ය. අවශ්‍ය වන්නේ නම් සභාපතිවරයාගේ උපදෙස් මත ලේකම්වරයා විසින් අතිරේක රැස්වීම් කැඳවනු ලැබිය හැක්කේ ය. පළාත් කමිටුවේ රැස්වීම්

(2) පළාත් කමිටුවේ රැස්වීමක ගණ පූර්ණය අවම වශයෙන් සාමාජිකයන් දසදෙනෙක් විය යුතු ය.

## IV වැනි කොටස

### ජන සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පිහිටුවීම, සංයුතිය හා කාර්ය භාරය හා බලතල

15. ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳව මෙහි මින්මතු "ප්‍රාදේශීය කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවක් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයෙහි පිහිටුවිය යුතු ය. ප්‍රාදේශීය කමිටුව

16. පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ ජීවත්වන්නාවූ ප්‍රජාවගේ සුබ විහරණය සඳහා අවශ්‍ය වන්නා වූ පානීය ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘතිවල තිරසාර පැවැත්ම සහතික කිරීම පිණිස අවශ්‍ය වන්නාවූ ප්‍රතිපත්තිමය හා කළමනාකරණ තීරණ ගැනීමට පළාත් කමිටුවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට දායකවීම ප්‍රාදේශීය කමිටුවේ පරමාර්ථය වන්නේ ය. ප්‍රාදේශීය කමිටුවේ පරමාර්ථ

17. ප්‍රාදේශීය කමිටුව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුත්තේ ය.- ප්‍රාදේශීය කමිටුවේ සංයුතිය

(අ) පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා ප්‍රාදේශීය කමිටුවේ සභාපතිවරයා ය.

(ආ) අදාළ පළාත් පාලන ආයතනයේ ජල හා සනීපාරක්ෂක විෂය භාර නිලධාරියා ප්‍රාදේශීය කමිටුවේ ලේකම්වරයාය.

(ඇ) ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතවරයෙකු,

(ඈ) පළාත් පාලන ආයතනයේ ලේකම්වරයා,

(ඉ) ප්‍රදේශයේ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා,

(ඊ) ප්‍රදේශයේ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා හෝ ඔහුගේ නියෝජිතවරයකු,

(උ) ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයේ පළාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් නම් කළ එම මණ්ඩලයේ නිලධාරියෙක්,

(ඌ) ප්‍රජා මූල සංවිධාන ප්‍රාදේශීය සංසදයේ සභාපතිවරයා සහ ලේකම්වරයා,

(එ) ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී.

18. පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ.- ප්‍රාදේශීය කමිටුව් කාර්යභාරය

(අ) පානීය ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක අවශ්‍යතා හා ගැටළු හඳුනා ගෙන පළාත් කමිටුව වෙත ඉදිරිපත් කිරීම,

(ආ) පවත්නා ජල හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘතිවල පැවැත්ම හා ප්‍රගතිය අධීක්ෂණය,

(ඇ) ප්‍රජා මූල සංවිධාන වල ක්‍රියාකාරකම් අධීක්ෂණය හා මෙහෙයවීම,

(ඈ) ප්‍රජා මූල සංවිධාන අතර අන්තර් සම්බන්ධීකරණය,

(ඉ) පළාත් ඒකකය විසින් කළ යුතු යැයි නියම කෙරෙන කාර්යයන් ඉටු කිරීම.

ප්‍රාදේශීය කමිටුවේ කාර්යභාරය වන්නේ ය.

ප්‍රාදේශීය කමිටුවේ බලතල

19. (1) ඉහත 18 වගන්තියේ සඳහන් කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා ප්‍රාදේශීය කමිටුවලට බලතල ඇත්තේ ය.

(2) පළාත් කමිටුව විසින් ඒකකයේ ප්‍රධානියා මගින් නියම කරනු ලබන කාර්යයන් කිරීම සඳහා අවශ්‍ය බලතල ඇත්තේය.

(3) ප්‍රාදේශීය කමිටුව විසින් ස්වකීය බලතල හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී පළාත් කමිටුව විසින් කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධි විධාන හා උපදෙස් වලට අනුකූලව ක්‍රියාකල යුත්තේ ය.

ප්‍රාදේශීය කමිටුවේ රැස්වීම

20. (1) ප්‍රාදේශීය කමිටුව යටත් පිරිසෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු අතර, අවශ්‍ය වන්නේ නම් සභාපතිවරයාගේ උපදෙස් මත ලේකම්වරයාට අතිරේක රැස්වීම් කැඳවිය හැක්කේ ය.

(2) ප්‍රාදේශීය කමිටුවේ රැස්වීමක සන පූර්ණය සමස්ථ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(3) ප්‍රාදේශීය කමිටුව විසින් එහි රැස්වීම් වල කාර්යය සහ කටයුතු කරගෙන යාම උදෙසා අවශ්‍ය පරිපාටි සම්පාදනය කර ගත හැක්කේ ය.

## V වැනි කොටස

### ප්‍රාදේශීය පානීය ජල හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය පිහිටුවීම

ප්‍රාදේශීය පානීය ජල හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය

21. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන ප්‍රාදේශීය කමිටුවේ පරමාර්ථ හා කාර්යයන් ඉටු කරලීම උදෙසා අවශ්‍ය වන ප්‍රාදේශීය පානීය ජල හා පාරිසරික සනීපාරක්ෂක ඒකක (මෙහි මින්මතු " ප්‍රාදේශීය ඒකකය" යනුවෙන් හඳුන්වනු ලබන) පළාත තුළ පිහිටි පළාත් පාලන ආයතන කාර්යාලයන්හි ස්ථාපනය කළ හැක්කේ ය.

ප්‍රාදේශීය ඒකකයේ කාර්ය මණ්ඩලය

22. 21 වගන්තිය යටතේ ස්ථාපනය කෙරෙන ප්‍රාදේශීය ඒකකයේ රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය වන්නා වූ කාර්ය මණ්ඩල සහාය ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයෙහි සේවයේ නියුතු ඕනෑම තනතුරක් දරන්නෙකුට රාජකාරි පැවරීම මගින් ලබා ගැනීමට නියමයන් මගින් විධිවිධාන සැලැස්වීම පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් කළ යුත්තේ ය.

ප්‍රාදේශීය ඒකකයේ පරිපාලනය

23. ප්‍රාදේශීය ඒකකයේ කෙරෙන සියලුම කාර්යයන් හා කර්තව්‍යයන් පිළිබඳව පාරිපාලනය පළාත් පාලන කොමසාරිස්වරයාගේ හා ඒකකයේ අධ්‍යක්ෂවරයාගේ මගපෙන්වීම්වලට අනුකූලව පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාට පැවරෙන්නේ ය.

ප්‍රාදේශීය ඒකකයේ වැටුප් හා දීමනා

24. 22 වගන්තිය යටතේ නිත්‍ය තනතුරෙහි රාජකාරිවලට අමතරව ප්‍රාදේශීය ඒකකයෙහි රාජකාරි පැවරෙන නිලධාරියෙකුට එසේ රාජකාරි පැවරීම මත සිය නිත්‍ය තනතුරට හිමි වැටුප් හා දීමනාවලට අතිරේකව පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් ගෙවිය හැක්කේ ය.

## VI වැනි කොටස

### මූල්‍ය ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රතිපාදන

25. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ මූල්‍ය ප්‍රතිපාදන ඃ

(අ) පළාත් සභාවේ වාර්ෂික ආදායම් වියදම් ප්‍රකාශන හා අයවැය ඇස්තමේන්තු මගින්,

(ආ) පළාත් පාලන ආයතනවල වාර්ෂික අය වැය මගින්,

(ඇ) රාජ්‍ය නොවන සංවිධාන හෝ පෞද්ගලික හෝ වෙනත් බාහිර මූලාශ්‍ර මගින්,

(ඈ) ව්‍යාපෘති සඳහා ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන මගින් සලසා දිය හැක්කේ ය.

26. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

(අ) "අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා ද,

(ආ) "ප්‍රධාන ලේකම්වරයා" යන්නෙන් වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයා ද,

(ඇ) "ලේකම්වරයා" යන්නෙන් පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද,

(ඈ) "කොමසාරිස්වරයා" යන්නෙන් වයඹ පළාත් පාලන කොමසාරිස්වරයා ද,

(ඉ) "ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලයේ' යන්නට 1974 අංක 2 දරන පනතින් සංස්ථාපිත ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලය ද,

(ඊ) "ප්‍රජා මූල සංවිධාන" යන්නෙන් ජන සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක සේවා සැපයීමේ හා කළමනාකරණය සඳහා සේවාලාභී ප්‍රජාව නියෝජනය කරමින් පිහිටුවා ගනු ලැබූ හා අදාළ නීතියක් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ ලියා පදිංචි කරනු ලැබූ සංවිධානයක් ද,

(උ) "ප්‍රජා මූල සංවිධාන දිස්ත්‍රික් සංසදය" යන්නෙන් දිස්ත්‍රික්කය තුළ ඇති සෑම ප්‍රජා මූල සංවිධාන ප්‍රාදේශීය සංසදයක් ම නියෝජනය කරමින් එකී සංසද විසින් සාමූහිකව පිහිටුවා ගත් සංවිධානයක් ද,

(ඌ) "ජල සම්පාදනය " යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 117 වගන්තියෙහි ගෘහ කාර්යයන් සඳහා වූ ජල සම්පාදනයට දී ඇති අර්ථ නිරූපනය ද,

(එ) "පාරිසරික සනීපාරක්ෂාව" යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හතර වැනි කොටසේ මහජන සෞඛ්‍යයට අදාළව දී ඇති අර්ථ නිරූපනය ද,

(ඒ) "පළාත් සභාව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද,

(ඔ) "පළාත් ඒකකය" යන්නෙන් වයඹ පළාත් පානීය ජල හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය ද අදහස් වේ.

මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.

08-179

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිළ** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.* - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2012** | | | |
| අගෝස්තු | 2012.08.03 | සිකුරාදා | 2012.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.10 | සිකුරාදා | 2012.07.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.17 | සිකුරාදා | 2012.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.24 | සිකුරාදා | 2012.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.30 | බ්‍රහස්පතින්දා | 2012.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2012.09.07 | සිකුරාදා | 2012.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.09.14 | සිකුරාදා | 2012.08.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.09.21 | සිකුරාදා | 2012.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.09.28 | සිකුරාදා | 2012.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2012.10.05 | සිකුරාදා | 2012.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.12 | සිකුරාදා | 2012.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.19 | සිකුරාදා | 2012.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.25 | බ්‍රහස්පතින්දා | 2012.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2012 ජූනි මස 23 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.